# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2240/23 – 2021 අගෝස්තු 11 වැනි බදාදා – 2021.08.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2014 නොවැම්බර් මස 07 වැනි දින අංක 1887/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළ කරන ලද 2014 අංක 318 දරන ආඥාවේ ඇතුළත් ඉඩම් කොටස් සම්පූර්ණයෙන් ම රජය සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබා ගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් අමාත්‍ය සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම එකී ඉඩම් කොටස් අතුරින් පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස් පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/6/2014/HW/10.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: කැප්‍රාලේ/8/1/3.
2021 අගෝස්තු මස 06 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
අංක 1200/6, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 582බී පැලැන්වත්ත නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පැලැන්වත්ත ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක CO/DSO/2020/136 හා 2020.07.10 දිනැති මායිම් පැහැදිලි කිරීමේ අනුරේඛනයේ පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස්.

01. **කැබලි අක්ෂර "බී" – දෙල්ගහකනත්ත – ප්‍රමාණය: හෙක්. 0.0013 ක් පමණ**

උතුරට: කො 9543 මූලික පිඹුරේ කැබලි අංක 37, මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර ඒ සහ සී; නැගෙනහිරට: මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර ඒ, සී සහ ඩී; දකුණට: ජේ. බී. ඒ. ජයසේකර සහ ටී. බී. ඒ. ජයසේකර හිමිකම් කියන දෙල්ගහකනත්ත ඉඩම; බටහිරට: ටී. බී. ඒ. ජයසේකර සහ අරෝෂි පෙරේරා හිමිකම් කියන දෙල්ගහකනත්ත ඉඩම.

02. **කැබලි අක්ෂර "ඩී" – දෙල්ගහකනත්ත – ප්‍රමාණය: හෙක්. 0.0009 ක් පමණ**

උතුරට සහ නැගෙනහිරට: මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර සී; දකුණට: ජේ. බී. ඒ. ජයසේකර හිමිකම් කියන දෙල්ගහකනත්ත ඉඩම; බටහිරට: ජේ. බී. ඒ. ජයසේකර සහ ටී. බී. ඒ. ජයසේකර හිමිකම් කියන දෙල්ගහකනත්ත ඉඩම්, මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර බී සහ ඒ.

08 - 391

1A – G34830 – 20 (2021/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*